# 3 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 06

## L3, S3, R3, W3
## නිපුණතා ආවරණය - 2021



- කැමැත්තෙන් හා රස විඳිමින් සවන් දෙයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කතා කරයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් ලියයි/අඳියි


සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



For Online Class details WhatsApp 071-9020298

# 3 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_3$ $S_3$ $R_3$ $W_3$ ඉගෙනුම් පල

- කැමැත්තෙන් හා රස විඳිමින් සවන් දෙයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කතා කරයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් කියවයි.
- කැමැත්තෙන් හා රස විඳිමින් ලියයි/අඳියි

## ළමා කවි/ගීත.

- පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

මගේ රට

පුංචි අපට සිරි සැප දෙයි
සිරි ලංකා දීපේ
පාන්දර ම එහෙන් මෙහෙන්
ඇසෙයි කුරුලූ ගීතේ
ඕලූ නෙළුම් පිපී වැනෙයි
පිරිලා වැව් ගානේ
ඇළ දොළ ගං ඉවුරු දිගේ
වන මල් පෙති පාවේ
සුදු වැල්ලේ කවඩි උඩින්
රළ පෙරළෙයි මූදේ
උසට උසේ කඳු ද පෙනේ
වලාකුළු ද ගැවේ

පිපෙන සමන් පිච්ච පොකුරු
නැළවෙයි හඳපානේ
ඉර එළියට හඳ එළියට
වෙලේ ගොයම් නැවේ
වනන්තරේ ගස් බිල්වල
මී පැණි බිඳු බේරේ
හරි සුවඳයි පැසෙයි ඉදෙයි
පලතුරු හැම වාරේ
පුංචි අපට සිරි සැප දෙයි
සිරි ලංකා දීපේ

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

1. පාන්දර ම ඇසෙන්නේ මොනවා ද ?

.....................................................................................................................

2. ඇළ දොළ ගංගාවල පාවෙන්නේ මොනවා ද ?

.....................................................................................................................

3. වලාකුළු ගැවෙන්නේ කොහේ ද ?

.....................................................................................................................

4. හඳපානේ නැළවෙන්නේ මොනවා ද ?

.....................................................................................................................

5. මෙම ගීතයෙන් කියවෙන්නේ කුමක් පිළිබඳ ව ද ?

.....................................................................................................................

6. ගීතය කියවා හිස්තැන් සම්පූර්ණ කරන්න.

- ඕලූ නෙළුම් පිපී වැනෙයි ............................................................
- උසට උසේ කඳු ද පෙනේ ............................................................
- පිපෙන ............................................................ පොකුරු නැළවෙයි හඳපානේ
- වනන්තරේ ගස් බිල්වල ............................................................
- පුංචි අපට සිරි සැප දෙයි ............................................................

- A 4 කොළයක් සහ පාට පෙට්ටියක් බැගින් සිසුන්ට ලබා දෙන්න. මගේ රට ගීතය ඇසුරින් චිත්‍රයක් ඇඳීමට උපදෙස් දෙන්න. තමා අඳින ලද චිත්‍රයට ගැළපෙන වාක්‍ය තුනක් අභ්‍යාස පොත්වල ලිවීමට සලස්වන්න.

## <u>කතන්දර.</u>

- කියවීම් පොතේ ඇතුළත් නොගැළපෙන රෝද කතන්දරය කියවා වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. පිට්ටනියේ තිබුණේ කුමක් ද ?
   (බයිසිකලයක්/පුංචි කරත්තයක්/සරුංගලයක්)

2. කරත්තයට සවි කර තිබුණේ
   (ගැළපෙන රෝදයි/බයිසිකල් රෝදයි/නොගැළපෙන රෝදයි)

3. අත් කරත්තය සෑදුවේ
   (රුං රුං පැංචා/බක බක අප්පුහාමි/ඉඳිකටු මුදියන්සේ)

4. හඬලන රාල පිතුම් හාමිට දුන්නේ
   (කැරට් අලයක්/ඇපල් ගෙඩියක්/රස කැවිලි සහ පාන් ගෙඩියක්)

5. මෙම කතාවේ යහළුවෝ හතර දෙනා
   (උත්සාහවන්ත යි/කම්මැලි යි/අකීකරු යි)

- කතන්දරය ඇසුරෙන් පිළිතුර ලියන්න.

1. කතාවේ සඳහන් යහළුවෝ හතර දෙනා කවුද ?

   ..........................................................................................................................................................

2. කරත්තය තල්ලු කිරීමට අපහසු වුයේ ඇයි ?

   ..........................................................................................................................................................

3. නාගෙන එන්නේ කවරෙක් ද ?

   ..........................................................................................................................................................

4. රුං රුං පැංචා ගෙන ආ රෝදයෙන් සෑදුවේ කුමක් ද ?

   ..........................................................................................................................................................

## <u>සංවාද.</u>

- පහත සඳහන් සංවාදය කියවා හිස්තැන් පුරවන්න.

### අපි හොඳ යාළුවෝ

අඹගස : තාරක පුතා මොකද අද පාඩම් කරන්න එන්න පරක්කු වුණේ ?
මම මේ මඟ බල බලා සිටියේ.

තාරක : ගුරුතුමී ගෙදර වැඩට ගණන් ටිකක් දුන්නා. මම ගණන් ටික හදලා ආවේ.

අඹගස : අදත් පුතා ආවේ පාඩම් කරන්න නේ ද ?

තාරක : ඔව් ඔව් අද මම කියවීම් පොත අරගෙන ආවේ. 'ගස්වැල් සුමිතුරෝ' කියන කවි පාඩම් කරන්න.

අඹගස : ඒක හොඳයි. මම ගැන කියන තොරතුරුත් තියෙනව ද ? කියන්නකෝ බලන්න ලස්සනට.

තාරක : කෝ අද ගිරා යාළුවා. වෙනදට නම් මෙතනට ඇවිල්ලා.

ගිරවා : ඉන්නවා. ඉන්නවා . . . මම මේ අඹ අත්ත උඩ. ඔයාලා දෙන්නගේ කතාව මට ඇහුණා.

තාරක : එහෙනම් දෙන්නම දූත් අහගෙන ඉන්න. මම කවි කියනවා.

බලන බලන හැම තැනක ම
කොළ පාටින් ගස් ගොඩයි
ගස් සෙවණේ සිටින විට දී
ගස්වැල් මිතුරන් වගෙයි

පුංචි පුංචි ගස් ලොකු වී
දළු මල් පල හටගනියි
ඒ මල් පල සැමට ම දී
මිතුදම තව වැඩි කරයි

ගිරවා : හරි ම ලස්සනයි. ගස් ගැන කවි ඇහෙන කොටත් සතුටු යි.

අඹගස : ඔව්. ඔව්. තාරක පුතා ලස්සනට කවි කිවුවා.

ගිරවා : තාරක පුතා අද අඹ කෑවෙත් නැහැ නේද ?

තාරක : තව ම කෑවේ නැහැ. ඔයාලත් එක්ක කතා කරන එක ඊට වඩා සතුටු යි.

ගිරවා : මම අඹ කඩල දෙන්න ද?

අඹගස : ඔව් ගිරා යාළුවේ. තාරක පුතාට අඹ කඩලා දෙන්න.

තාරක : නංගිටයි, මල්ලිටයි, මටයි ගෙඩි තුනක් තිබුණා ම ඇති.

අඹගස : තාරක පුතා හරි ම හොඳයි. හැම දා ම නංගිටයි, මල්ලිටයි අඹ ගෙනියනවා.

තාරක : ස්තුති යි ගිරා යාළුවේ. මට අඹ දුන්නට අඹ ගසටත් බොහෝ ම ස්තුති යි.

අඹගස : තාරක පුතා පරිස්සමින් ගෙදර යන්න. හෙටත් පාඩම් කරන්න එන්න.

ගිරවා : ඔව් හෙටත් එන්න. අපි දෙන්න ම බලාගෙන ඉන්නවා.

ජම්බු ගස : කවීෂ පුතා, ඇයි අද අහක බලාගෙන යන්නේ ?

කවීෂ : ..................................................................................................

ජම්බු ගස : මේ දවස්වල ජම්බු ගහේ ගෙඩි පිරිලා

කවීෂ : ..................................................................................................

ජම්බු ගස : පුතා ආසාවෙන් ජම්බු කනවා. ඒක දකින කොට මට ගොඩක් සතුටු යි.

කවීප : ..........................................................................................................................

## චරිතාරෝපිත ව කතා කිරීම.

- කියවීම් පොතේ ඇතුළත් හරි පුදුමයි පාඩම සහකියවීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් කියවන්න. (සහකියවීමේ ක්‍රමවේදය යනු ගුරුවරයා නිවැරදි ව සහ හැඟීම් ප්‍රකාශ වන පරිදි ශබ්ද නගා කියවන අතරතුර දී සිසුන් ඒ සමග මුමුණමින් කියවීම යි.) පහත මාතෘකා අතරින් කැමති මාතෘකාවක් තෝරාගෙන මාතෘකාවට අදාළ රූපය ඇඳ තමා එම චරිතය යැයි සිතා ඒ පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ගිරවා, මොනරා, මාළුවා, අලියා, සමනලයා)

..............................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

## චිත්‍ර කතා

- පහත දැක්වෙන චිත්‍ර කතාව කියවා අනෙක් චිත්‍ර කතාවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.




රජතුමනි, මී මැස්සොයි අපියි දෙගොල්ලන්ම කරන්නේ කෑම එක් රැස් කිරීම. ඒත්...මිනිස්සු අපිට වඩා මීමැස්සන්ටයි කැමති ඇයි ඒ. . .
ඒ ප්‍රශ්නයට උත්තරේ දන්නේ මීමැසි රැජිණ යි. ඇයගෙන් අසන්න.


රැජිණියනි, කුහුඹියි, මීමැස්සොයි දෙගොල්ලන්ම කරන්නේ කෑම එක්රැස් කිරීම. ඒත් මිනිස්සු අපිට වඩා මීමැස්සන්ටයි කැමති. ඒකට හේතුව පවසන්න.
ඔබ කියූ කාරණය ඇත්ත. ඔබ කෑම රැස් කරන්නේ වැසි කාලයට ඔබට ම කන්නයි. අපි කෑම රැස් කරන්නේ අපිට කන්න පමණක් ම නොවෙයි. අනිත් අයගේත් ප්‍රයෝජනයට. ඒක තමයි හේතුව.


ආ . . . කොහොමද, හා පැංචෝ, කොහාටද මිකා යන්නේ


හැබැයි
කැරට්
කන්න
පුළුවන් ද?


මටත්
ආසයි කැරට්
කන්න.




- සංවාදය සම්පූර්ණ කරන්න.



| | |
|---|---|
| මල :- | පිච්චෙන්න අව්ව සැරයි. |
| ගෙඩිය :- | ඔබේ ලස්සන අඩුවෙයි ද? |
| මල :- | මගේ ලස්සන අඩුවෙන කොට ඔබටයි අවාසි. |
| ගෙඩිය :- | ඇයි ඒ? |
| මල :- | මම නිසානෙ ඔබ හැදෙන්නේ. |

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................